## විසිරුණු පෙති
ශෂිකලා නුවංගි

සඳවත අහසින් බැස යයි රහසින්
නොහඬන් සේපාලිකා මලේ....
ගණඳුර බිඳ දා හෙට හිරු ඒවී
සැඟවෙන් සඟවා සුවඳ නුඹේ ...

ගව් ගණනක් දුර ලුහුබැඳ ගිය මුත්
මිරිඟුව  මහ සමුදුරක් නොවේ...
පියකරු පැහැ ගත් හලහල විෂ බිඳ
කිසිදා අම රස බිඳක් නොවේ....

පරසතු කුසුමන් මිලින නොවේ මැයි
නුඹ නම් වනපස මලකි දුවේ ...
දෑඟිලි තුඩපත් වියැකී යන මුත්
විසිරුණු පෙති යළි මලක් නොවේ....

## වෙසක් මහේ
ජගත් වෙත්තසිංහ ක්රේගිබර්න්

''අග වෙමි ලොවට'' පැවසුව සිහ රදකු විසින්
දිග නිම කළා සසරෙහි පොඩි කුමරැ විසින්
නැග විත් වෙසක් සඳ ලුම්බිණි උයන දෙසින්
මග හෙළි කළා ලොව සිදුහත් උපත ලෙසින්

අවබෝදයෙන් සියලුම කෙලෙසුන් නැසුව
සතහට නිබඳ සදහම් අම රස දෙසුව
දෙව් දේවතාවන් සපැමිණ බණ ඇසුව
කාලය එළඹුණා හිමි බුදුවුනු පසුව

තුන්ලොව නැගුණු හඬ දම්සක් පැවතුමය
බුදු දේසනය ලොව සැනසුව ඇමතුමය
සිත පහදවා යුතු තෙරැවන නැමදුමය
නිවනින් නිවෙන දුරැ කතරක නැවතුමය

## දෙවියන් සොයා යන්නෝ
ආනන්ද ගුණතිලක  හොපර්ස් ක්‍රොසිං

තිස් වසරක්ම කොටියන්ගෙනි බැට කෑවේ
එය නිම කරන් දස වසරකි ගත වූවේ
මුස්ලිම් ත්‍රස්ත වාදය අද උඩ ආවේ
දෙවියන් සොයා එන අයටයි පත බෑවේ
රජයට - බුද්ධි අංශය දැන්වූ බවට
තොරතුරු හෙලි වෙලා පැතිරෙන මුත් දැනට
මහ උන් සැඟවිලා රහසෙම මර බයට
යැව්වා අහිංසක ජීවිත මරු කටට
තුන්සිය පණස් නවයක් අපෙ නෑ පිරිස
මිය ගිය සොවින් - අඳුරැයි අද හැම නිවස
රෝහල් තුලයි පන් සියයට වැඩි කොටස
කම්මුල් මත දැනේ උණු කඳුළැලි පහස
ආරක්ෂක පදව්වල වග කිව යුත්තෝ
මහජන මුදල් කා ගෙන සැප විඳ ගත්තෝ
රාජකාරි හරි හැටි බැරි උනු ඇත්තෝ
කට මැත දෙඩන්නට නම් මහ දැන මුත්තෝ

## අවුරුද්දයි, ඔබයි, මමයි.
ප්‍රේමසිරි ගුණතිලක

කොල හැලිලා මල් පිපිලා එරබදු රත බබලන විට
අවුරුදුදා ඔබෙ ඉණ වට එතී සැලෙන චීත්තයේ
පාට පාට මල් වලින්ද සුවඳ හමන්නේ

කපුටු කැදැල්ලෙන් බැහැරට පැන නටනා කොහෝ පැටව්
සත් සරයේ ඇබෑසි ලැබ හඬන නදත් පරදන්නට
රබන් පදේ තාලෙට  ඔබෙ ගීය ඇසෙනවා

කැවුම් කොකිස් සුවඳ අතරෙ කෝඳුරු වැල් දඟලන විට
නිතඹ සලා රැකුල අරන් පදින ලෙසට ඔංචිල්ලා
මුකුළු සිනා දෝලනයක් සිතේ මැවෙනවා

නැකත බලා ලිප මොලවා ගිනි මත්තේ ඉදෙන බතේ
නෑඹිළියට යටින් එබී උතුරන කිරි පෙණ බුබුලක්
දුමක් දමා පුපුරන විට සෙනෙහස පිරි ආදරයක,
උනුසුම් සුව දැනුනා මට.

යසට ඉදුන කෙසෙල් ඇවරි දිළිසි දිළිසි කහ පාටට
කිරි බත් කැටි හකුරු දෙබෑ මුං අලුවා කැවුම් කොකිස්
ඉඳුල් නොකල රසැති බොජුන් අතුරුවලා මේසය මත
ඔබත් සමග පවුලේ සැම  සුභ මොහොතට බුදිනා විට
අනාගතේ අප එක්වී  තනනා නව කැදැල්ල තුළ
ඔබයි මමයි දරු කැලකුයි ඉන්නා ලෙස දැනෙයි මෙමට

බක් මාසේ අකුණු එළිය ගෙරවුම් හඬ සමනය වී
වැස්ස සිඳුනු නිල් තණ මත හිමිදිරියක හිරු කිරණින්
පිනි බිඳු කැට දිලිසෙන විට ගෙවුනු වසරෙ දොලොස් මහේ
ආදරයට තුති පුදන්න බුලත් හුරුල්ලක අත් යට
දෙගුරුන්ගේ දෙපා මතට ඔබෙ දෑසින් වැටෙන කඳුළු,
බිඳක් පෙනෙනවා.

## දුරු රට මිණිබිරිය
ජයසේන කොඩිතුවක්කු වත්තල - ශ්‍රී ලංකා

දෙව් ලොව අතැර මනුලොව පිය නගන විට
සඳ කුමරියේ දුන්නද ඔබෙ රුව ඇයට
සුරතල් සිනහ මල් මුවගින් සැලෙන විට
සඳ කුමරිය පරාදයි ඇගෙ රූ  වතට

තබමින් පොඩි දෙපා යන සුරතල් ගමන
මල් ගොමුවෙක සරන සමනලියක ලෙසින
බැරිමුත් ලොකු කතා බහ එක දෙක වචන
හැඩ කර කියයි සීයට ගුවනේ දකින

සිත යට රැඳුන පැතුමකි ටිකකලෙක සිට
උතුරන සතුට නිම්හිම් නැත ලියන්නට
සැමදා නිරෝගී සුව සෙත ලබන්නට
දළදා සමිඳු පිහිටයි මගෙ මිණිබිරිට






